ආචාර්ජනා විමසුම
**හෙන්රි ඩී කුමාරප්පෙරුම**
සිනුවර සිට.

# සුභාවිත ගීතයේ නැවුම් පැතිකඩ




ඕස්ට්‍රේලියානු සිංහල උප සංස්කෘතියේ සිංහල සාහිත්‍ය විකාශනය පිළිබඳ සොඳුරු අනාගතයකට කිසියම් අරුනළු පතිත වීමක් දැක ගත හැකි වීම සතුටකි. විසි වන සියවසේ අගභාගය විසි එක් වන සිය වසට සපයන පූර්විකාවක් ලෙසින්දෝ මේ වන විට බහු සංස්කෘතික ඕස්ට්‍රෙලියාවේ සිංහල පද්‍ය ගද්‍ය ගීත නාට්‍ය ආදී කලාංග රාශියක් බිහිවී ඇත. නිව්සවුත්වේල්ස්හි සිඩ්නි පුරවරයෙන් බිහිවූ සන්දේශ කාව්‍යයක් ඛණ්ඩකාව්‍ය රැසක් නවකතා කෙටි කතා මෙන් ම නාට්‍ය ද ගීත සමුච්චයන් ඇතුළත් කළ සංගත ගී තැටි රාශියක් ද මේ වන විට බෙහෙවින් ජනප්‍රියත්වයට පත් වෙමින් ඇත.

මේ අතුරින් අවසනට දැක්වූ සිංහල ගීත සාහිත්‍යය පෝෂණය කරලීමට උත්සුක වූ විද්වතුන් කිහිප දෙනෙක් අතුරින් සිනුවර වාසී ආචාර්ය උබයසිරි විජයනන්ද වික්‍රම මහතාට හිමිවනුයේ ප්‍රධාන තැනකි. සංක්‍රමණිකයන් පිළිබඳවත් ඒ හා බැඳී ගිය නීති රීති මෙන් ම එහි ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පසුබිමත් විග්‍රහයට ලක් කරමින් ලබාගත් ආචාර්ය උපාධියක් ද සමගින්, ඉංග්‍රීසි ගුරු තනතුර දරමින් විසි වසරක ට වැඩි සේවයක් සංක්‍රමණිකයන් වෙත ලබා දී ඇත. සිය පෘථුල භාෂා සාහිත්‍ය සේවාවන් ප්‍රජා සංගම් හරහා මෙන් ම එස්. බී. එස්. සමස්ථ ඕස්ට්‍රේලියානු ගුවන් විදුලිය හා පුවත් පත් වැනි ජනමාධ්‍ය මගින් ද දැනටමත් සිංහල ජන පදනමට කරමින් සිටිනුයේ මහඟු සේවාවකි.

ආචාර්ය උබයසිරි විජයනන්ද වික්‍රම මහතා 2016 දෙසැම්බර් 11 වැනි දින සිනුවරදී එළි දක්වන්නට යෙදුන සංගත ගී සමුච්චය ගීත 14කින් යුක්තය. මෙම අන්තර්ගතය තුළ පැහැදිළිව දක්නට ඇත්තේ සිය භාෂා සාහිත්‍ය මෙන් ම පුද්ගල සමාජ චර්යාව පිළිබඳ ගැඹුරු හා විධග්ද වැටහීම ගීතයන් තුළ ප්‍රසාරණය කර ඇති ආකාරයයි. ආදරය ආලය පිළිබඳ සුසංයත මාණයන් මෙන් ම ජීවන දර්ශනය දහමට නතු කළ පරිනත හැඟුම් බොහෝ ගීත තුළ සඟවා තිබීම ම ගීත ශ්‍රාවකයා අමන්දානන්දයට පත් කිරීමකි. තමන් විසින් නිර්මිත භාවමය ගීත 10කින් ද සිය බිරිඳ වන උයද භද්‍රා මහත්මිය ගේ නිර්මාණ දෙකකින් ද යුතුව අපූර්ව ගීත 14ක් එම අන්තර්ගතයට එක්කොට සුභාවිත ගීතයෙහි පෝෂණයට උර දී ඇත.

සුගායනයෙන් ඉතා ඉහළ දස්කම් දක්වන අද දවසේ ගායන ක්ෂේත්‍රය ඔපවත් කරනුලබන සංගීත් නිපුන් ආචාර්ය සනත්නන්දසිරි, සුනිල් එදිරිසිංහ, ටී. එම්. ජයරත්න, එඩ්වඩ් ජයකොඩි, නෙලු අධිකාරී වැනි ගායක ගායිකාවන් දොළොස් දෙනෙකුන් විසින් ගායන දස්කම් දක්වනුයේ ඉන්ද්‍රජිත් මිරිහානයන් ගේ මිහිරි තනු තත්සරයනට සමවැදෙමිනි

සිංහල ගීත සාහිත්‍යය අද වන විට පසු කර ඇති කඩයිම් හි සීමාවන් හා අන්තරීය විභෙදනයන් පිළිබඳ කාලීන සංවාදයක් ජන සන්තාන ගත කිරීමෙහි කාලෝචිත බවක් පෙනේ. යුග නද්ධ සිංහල සංගිතාවලියෙහි රසාලිප්ත බව ලෝකයේ කවර සංගීත ක්ෂේත්‍රයකටද නොදෙවෙනි වන අයුරු දැකගත හැක්කේ එහි ආදි මධ්‍ය නූතන වශයෙන් වූ ගලා ගිය විකාශනයන් ගැන පැහැදිළි කර ගැනීමෙන් ම ය.

ක්‍රි.පූර්ව 5 වැනි සියවසෙන් මෙපිට අපට දක්නට ලැබෙන ලිඛිත ඉතිසාසය පවසන අන්දමට ආදියේ සිටි ගෝත්‍රික මුතුන්මිත්තන් පවා ගීතයෙන් ලබා ඇති වින්දනය අපමණය. මහාවංශය මූලාශ්‍ර කොට ගෙන ලබා ගන්නා තොරතුරු අනුව අපට හමුවන මූලාන්තයක් ලෙස දැක්විය හැකි වන්නේ විජයාගමනය වන අවදියේ ද ඇතමුන් ගීත කියමින් නැටුම් පවත්වපු අවස්ථා දක්නට ලැබෙන බවය. සිරසවත්ථුපුර විත්‍රජ හා කාලවේල දෙදෙනාගේ මේ ගීත ගායනය හා නැටුම් එදා ගෝත්‍රික ජනයා බෙහෙවින් ප්‍රබෝධමත් කර ඇති බව මහාවංශය පවසතත් එම ගීතයන් ගේ ස්වභාවයක් හෝ භාවිතය නිස්සාරණය කරගැනීමක් දක්නට නැතිවීම අඩුවකි.

අනුරාධපුර සමය වන විට ගීත සංකල්පනාවන්හි වඩා වර්ධනය වීමක් දක්නට ඇත. එදා වන විට ගීතමය රටාවක පද බන්ධන සිදුවෙමින් පැවැත්තේ පොදු ජනයාගේ සිතැගි බෙහෙවින් ගීතයට නතුවීමත් සමග ම ය. රාජධානියක් පමණක් නොව කලාගාරයක් ද වූ සීගිරිය නැරඹුවෝ සතිමත් භාවයෙන් යුතුව ඇසු දුටු දේ මෙන් ම දැනුනු දේ ද ගීත මනෝභාවයන් ලෙස කැටපත් පවුරෙහි ලියා තැබූහ. ආලකමන්දාවෙහි මිහි බට දෙවඟනන් වන් මනහර කාන්තාවන් ද, ඔවුන් ගේ නෙතග බැල්ම ද එම ලාලනියන් සියුමැලි දෑඇඟිලි තුඩුවලින් ගත් සියපතෙහි, නිලුපුලෙහි සුගන්ධය පවා දැනී ගිය අයුරක සංවේදී චිත්තවේග ගී බවට පත් කළහ. ඒ සඳහා ඔවුනොවුන් දැක්වූ උත්සුක භාවය ආයාසයෙන් තොර වූහ. ඔවුන් ගේ ආකල්ප පරිකල්ප තුළ ඔවුන් ගේ ජීවන තොරතුරු මෙන් ම සමාජමය වටපිටාව ද උද්දීපනය කර ඇත්තේ සීගිරි කැටපත් පවුර පන්හිඳට හසුවූ තල්පතක විළසිණි.

කාලය සියවස් ගණනින් ඉක්ම යද්දී යුග යුග වශයෙන් බෙදී ගිය සිංහල සාහිත්‍ය පිළිබඳ ඉතිහාසය අපට පවසනුයේ කුමක් ද? ඓතිහාසික ව අප ලබා ඇති සාහිත්‍ය පුරාවෘත්තයන් සිංහල ජාතියේ ප්‍රවුඪත්වය මොනවට කියා පායි. කාව්‍යයෙන් ආරම්භවී කාව්‍ය ශාස්ත්‍රයක් බවට එය වර්ධනය වීමත් සමග ඒ හා අනුයාත වෝහාරික නීති රීති සමුදායක් මගින් ගීය ගීතය සින්දුව හා කාව්‍යය ආලංකාරික සම්ප්‍රදායන් ලෙසින් පාද යති මාත්‍රා ආදියෙන් සරසා ඇද බැඳ තබන්නට තරම් නම්‍යශීලී වී ඇත. සෑම ප්‍රකාශයකට ම භාෂාව අදහස් ජනනය කරන මාධ්‍යය ලෙස දැක්විය හැකිය. භාෂාව පිළිපබඳ භාවිතය අතිශයින් වැදගත් වනු ඇති බව වියත් මතයයි.

**රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දීදී විදුලිය පබා**
**රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනුපා තබ තබා**
**කම්පසේ දෙන සැරලෙසේ නෙත බලබලා නෙතගින් සොබා**
**මම් කෙසේ පවසම් එසේ වර සුරළඳුන් දුන් රඟ සුබා**

කෝට්ටේ යුගය අසිරිමත් කළ සිරි රහල් හිමියන් ගේ සැළලිහිණිය, කව්සේකරය හැරුණු විට කාව්‍යයේ ඇති ගීතමය ස්රූපය එළි දැක්වෙන ඉතා ම මිහිරි කාව්‍ය පදවැල් ලෙසින් ඉහතින් දැක්වුණු වෑත්තෑවේ හිමියන්ගේ ගුත්තිල කාව්‍යයේ එන මරඟන රැඟුම් කාව්‍ය සංකල්පනා ගීතයක් වූ අයුරුය ඒ. හෙළයේ ගීත කෝකිලාවිය වන ලතා වල්පොල මහත්මිය ගේ මියුරු ගී ස්වර නාද සංකලනයක් බවට පත්ව ඇති ආකාරය මන නන්දනීය වී ඇත.

ආචාර්ය වික්‍රමයන් ගේ ගීත වික්‍රමය දහසක් සිතුවිලි ගී සංකල්පණා අතරට එක්ව ඇති 'පැරමැටා ගඟ' ගලා බසිමින් කියනුයේ ඔසී දේසයේ මුල් වැසි දනන්ගේ අවිහිංසක වගතුගය. එමෙන් ම 'වත්ත පහළ ඉර පායා'', 'ගම දෙකොනේ අපි ඉන්නේ මැද ගුරුපාරකි යන්නේ' ගීතයන්ගෙන් හෙළි කරන්නේ ජීවිත අභ්‍යන්තරය ගැඹුරින් දකින අයුරුය. 'දිනිඳු සැඳෑ කඳු අතරින්' ගීතය ගැමි ගෙවිලියක ගේ ජීවන ගමනේ භාවික සංකල්ප අපූරුවට නිරූපණය කර ඇත. 'දුටු දුටු දන මන නන්ද' ගීතය ඇසෙත් ම දෙණිපිටියේ නුග රුක හා ගජමන් නෝනා ගේ කවිකාරත්වය නිතැතින් ම සිහිකැඳවනු ඇත. උයද භද්‍රා මහත්මිය ගේ ගී සංකල්පණා දෙකක් තුළින් විශ්‍දාන ගත වන්නේ බෞද්ධ දර්ශනයේ පූර්වාදර්ශයන් ගෙන් බිඳකි. භාවමය ගීත සමුදායක් සිය ජාතිකත්වය ඔප්නංවමින් ඕස්ට්‍රේලියානු සිංහල උපසංස්කෘතියට මුදා හැරීම භද්‍රා මහත්මියගෙන් මෙන් ම ආචාර්ය උබයසිරි විජයනන්ද වික්‍රම මහත්මාගෙන් ද සිදුවූ විශිෂ්ඨ සේවාව ඉතසිතින් අගය කළ යුත්තේ , භාෂාවට සාහිත්‍යයට ලබා දුන් ප්‍රබල උත්තේජනය නිසා ය.

ලොව කොහි සිටියත් මිනිසාට සමාජ චර්යාව බලපාන ආකාරයෙහි විවිධත්වය ගීත සංකල්පණා බවට පත් කර ඇත්තේ අනුවේදනීය ආකාරයෙනි. සොඳුරු ගැමි බව, සොබා දහමේ ආකර්ශනීයත්වය හා දේශාටනයේ අපූර්වත්වය මෙන් ම, දෛනකව මිනිසා සිය එදිනෙදා ජීවන ගමනේදී ඇතිකර ගන්නා හා තමා ගැඹුරින් පසක් කර නොගන්නා දහසකුත් එකක් අදහස් උදහස් මෙන් ම සිතුවිළි දාමයන් සමුදායක් විචක්ෂණ රූපකයන් බවට පත්කර භාවික ගුණයෙන් යුතුව පන්හිඳ මෙහෙයවා ඇති ආකාරය සෑම ගීතයකින්ම හෙළි දක්වා තිබීම ප්‍රශංසනීය වේ.

වර්තමාන ගීතාවලියේ පියවර මැනීම දුර්දශාපන්න මොහොතකට පත්වෙමින් ඇති බව දැකිය හැකි වන්නේ ලොව නොනැසී පවතින ආදරය ප්‍රේමය ඉදිරියේ මානුෂීය බව ගිලිහෙමින් යන ගමනක් ලෙසිනි. විරහව අනුවේදනීය බවෙන් මුදවා කෘෘර සංකල්පණා බවට පත් කරමින් ඇති බවක් පෙනී යන මොහොතේ, ''හන්තානෙට පායන හඳ ලස්සනැයිද කියන්න'' ''වියෝ වූ පසුවයි දැනෙන්නේ ප්‍රේමයේ අබිමන්'' වැනි ප්‍රබුද්ධ ගී ඉඳහිට හෝ බිහි වීම සතුටක්. ගීතයක ප්‍රේමණීය බව හා සදාතනික බව විරහව ප්‍රේමය ආදරය ආලය මානව හිතවාදය මෙන් ම මනු මන් පැවැත්ම ද සුසංවිහිත කර ලනු ඇත. එයට රුකුළක් සැපයීම් වස් 'දහසක් සිතුවිලි' නයින් ආචාර්ය වික්‍රම විද්වතාණන් විසින් ගීත ලෝකයට දායාද කර ඇත්තේ අපූර්ව හා රමණීය සිතුවිලි රාශියකි,

දශක තුනකට ආසන්න කාලයක් සිය මව්බිමෙන් බැහැරව සංක්‍රමණික ඕස්ට්‍රේලියානු ජන ජීවිතය අගයකරමින් විප්‍රවාසී බවෙහි ගැඹුර හරය හා ඊහා බැඳී ගිය සමාජ සත්තාවන් සුභාවිත ගීත පෝෂණයෙහි අභිවෘද්ධියට යෙදවීමෙහිලා ආචාර්ය උබයසිරි විජයනන්ද වික්‍රම මහතා සහ උයද භද්‍රා මහත්මිය ද කර ඇත්තේ මහඟු සේයවයකි. කලාව සෙXන්දර්යය රසවාද හා අනෙකුත් විෂයාන්තර දැනීමෙන් ද බහු සංස්කෘතික ප්‍රජාවට ඉටු කරනු ලබන මහඟු සේවාවට අලුතින් එක් කර ඇති මෙම සංගත ගී තැටිය හෙළ මියැසියට හා ගීත ලෝලයිනට බෙහෙවින් ආශ්වාද ගෙන දෙන්නක් වනු ඇත.